# බෞද්ධ මානව විශේෂතාවාදය

(යථාතත්වය පිළිබඳ බෞද්ධ මතය ඇසුරින් කෙරෙන විමර්ශනයකි)

කඹුරුගොඩ සොරත හිමි

## හැඳින්වීම

පෙරදිග හා අපරදිග ලෝකයේ සම්භාවනාවට පත් වූ ආගමික දර්ශනයක් ලෙසින් බුදු සමය පිළිගැනී ඇත. මිනිසා සහ ඔහු නොවන ලෝකය පිළිබඳ පළල් විමර්ශනයක් ඒ තුළ අන්තර්ගතව තිබේ. එසේම සමස්ත ලෝක ක්‍රියාවලිය තේරුම් ගැනීමත්, එමගින් වඩාත් නිවැරදි හා සංවර්ධිත ලෙස එය පරිහරණය කිරීමත්, එයින් අනුමත කරේ. මෙහි "පරිහරණය කිරීම" යනුවෙන් දැක්වීම සමහරුන් කරමින් විමතියට පත් කරවන්නක් විය හැකිය. එහෙත් මා මෙහිදී අදහස් කරන්නේ, හැටලිලි සහගත වූ සංකල්පීය දෘෂ්ටියෙන් ලෝකය දැකීම හා අත්විඳීම අත් හැරීම යි. එම අත්හැරීම පරම තත්වයකට පත්වීමක් වේ. එය විශේෂතත්වයක් ලෙස දැක්වුවත් ඇත්තෙන්ම සිදුවන්නේ, වඩාත් සංවිධිත ලෙස ලෝකය දැකීමයි. සංකල්පීය දෘෂ්ටියෙන් ක්‍රියාවලින් ග්‍රහණය කිරීම ඇතිවන්නේ මිනිසාට (මිනිස් අත්දැකීමට හා මනසට) සාපේක්ෂකව බවත්, එම සංකල්පීකරණයෙන් මිදීමේ හැකියාව ඇත්තේද ඔහුටම බවත් පිළිගැනීම, මෙහිදී නිවැරදි වේ.

බුදුසමය ලෝකය දකින්නේ මිනිසා සහ ඔහු නොවන ලෝකය යන "සමස්තයක්" (Totality) ලෙසිනි. මෙම සමස්තය තුළ මිනිසා "සුවිශේෂතාව" වේ. "මානව කේන්ද්‍රියත්වය" "මානවවාදය" යන වචනවලින් මෙම සුවිශේෂතාව දක්වන්නට යාමෙන් එහත් ගැටලු සහගත තත්වයකට පත් වේ. මිනිසා ඔහු නොවන ලෝකය තමා වෙතට ඌහනය කර ගැනීමට දරණ උත්සාහයන්ගෙන් බටහිර දර්ශනය පිරී ඇත. බටහිර මෙම යුදෙව් සංවර්ධන ආකෘතිය පවත්වා ගෙන යාමට ශක්තිමත් න්‍යායික ආචාර්යයන්